# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**AAT/ 66 /2025 (PSC)**
**AAT/ 67 /2025 (PSC)**

කේ.කේ.සී.ශිරෝමලි,
එන්.එම්.ඒ.කේ.නවරත්න,
**අභියාචකවරුන්**
**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
**වගඋත්තරකරු**

**දිනය :-2026.05.05**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචකවරුන්
කේ.කේ.සී.ශිරෝමාලි,
එන්.එම්.ඒ.කේ.නවරත්න,
අභියාචකවරුන් වෙනුවෙන් නීතිඥ තුෂාරි බුද්ධදාස මිය,
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් තිළිණි ලියනගේ මිය.

## -නියෝගය-

## ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය

අභියාචකවරුන් ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ජ්‍යේෂ්ඨ සංඛ්‍යාලේඛනඥ නිලධාරීන් ලෙස සේවය කරනු ලබයි. ඔවුන් 2007.12.03 දින සංඛ්‍යාලේඛනඥවරු ලෙස සේවයට එක්වී ඇති අතර, 2009.10.15 දින සිට ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ තනතුරේ සේවය කරති. අභියාචකවරුන් සියළු කාර්යක්ෂමතා කඩඉම් සමත්ව ඇති අතර, දෙවැනි භාෂා අවශ්‍යතාවය සහ ඊළඟ උසස්වීම් සඳහා සියළු සුදුසුකම් සපුරා ඇත. ඒ අනුව අදාළ තනතුරේ II ශ්‍රේණියට උසස් කරන ලෙස ඉල්ලා ඇති අතර,

2019.10.15 දින සිට අදාළ II ශ්‍රේණියට උසස් කර ඇත. එසේ වුවත් අභියාචකවරුන් ඉල්ලා සිටින්නේ, 2017.12.03 දිනට II ශ්‍රේණියට පත්වීම පෙරදාතම් කර දෙන ලෙසය. ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කළ ඉල්ලීම ප්‍රතික්ෂේප වී ඇති අතර, එම තීරණයෙන් තෘප්තිමත් නොවූ අභියාචකවරුන් මෙම විනිශ්වය අධිකාරයට අභියාචනයක් ඉදිරිපත් කරමින් ඉල්ලා සිටින්නේ, 2017.12.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කරන ලෙසට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට නියෝගයක් ලබාදෙන ලෙසයි. අදාළ ඉල්ලීම සනාථ කිරීම සඳහා අභියාචකවරුන් 2026.01.05, 2026.03.17, 2026.03.04 දින දරණ ලිපි හා ඇමුණුම් මඟින් කරුණු ඉදිරිපත් කර සිටී. ඊට වැඩිමනත් ලෙස විවෘත අධිකරණයේ දී වාචික පැහැදිලි කිරීම් ද සිදුකරන ලදි. මේ සියළු කරුණු සාරාංශ ලෙස මෙසේ දැක්විය හැකිය.

(1) අභියාචකවරු 2006.03.11 දින සංඛ්‍යාලේඛනඥ බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා ඉදිරිපත් වී, සුදුසුකම් ලැබ 2007.12.01 දින සංඛ්‍යාලේඛනඥවරුන් ලෙස රාජකාරී භාරගෙන ඇත.

(2) අදාළ තරඟ විභාගයේ 46 දෙනෙකුගේ නාම ලේඛනයක්, ලැබූ ලකුණු ප්‍රමාණයන් අනුව විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇත. ඇමුණුම් 1 ලෙස එය ඉදිරිපත් කරයි.

එම ලේඛනයේ අභියාචකවරු සහ තවත් අය සිටින ස්ථාන පහත පරිදිය.

| ස්ථානය | අභියාචක නම | ලකුණු | වැඩ භාරගත් දිනය |
|---|---|---|---|
| 08 | ශිරෝමලී | 122 | 2007.12.03 |
| 19 | නවරත්න | 116 | 2007.12.03 |
| 22 | පුෂ්පකුමාරි | 112 | 2007.12.03 |
| 23 | ද සිල්වා | 112 | 2007.12.03 |
| 27 | සිසිලරත්න | 108 | 2008.04.01 |
| 29 | දීපවංශ | 108 | 2008.04.01 |
| 30 | වීරතුංග | 108 | 2008.04.07 |

03. අභියාචකවරු 2006.02.18 දින පැවති ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ තනතුර සඳහා බඳවා ගැනීමේ විභාගය සඳහා ද පෙනී සිට ඇත. අදාළ විභාගය සමත් වූවන් සඳහා 2009.05.28 දින සම්මුඛ පරීක්ෂණ පවත්වා, 2009.10.15 දින තෝරා ගත් අයට පත්වීම් ලබා දී ඇත.

04. අභියාචකවරුන් ද මෙම තනතුරු දැනට සේවය කරන තනතුරුට වඩා ඉහළ නිසාත්, වැටුප් වැඩි නිසාත්, ඉක්මනින් උසස්වීම් ලබා ගැනීමේ අරමුණින් එම තනතුරු භාරගෙන ඇත. එසේම සේවා කඩවීමකින් තොරවම අදාළ තනතුරට පත්වී ඇත. ඒ පිළිබඳව ලේඛනය වයි.4 ලෙසට අමුණා ඇත. ඒ අනුව 2014.11.07 දිනට මේ අයගේ ජ්‍යෙෂ්ඨතාවය පහත පරිදිය.

| **නම** | **ජ්‍යෙෂ්ඨතා අංකය** | **සං.ලේ.නිලධාරි** | **ජ්‍යේ.සං.ලේ.නිලධාරි** |
|---|---|---|---|
| කේ.කේ.සී.ශිරෝමලී | 69 | 2007.12.03 | 2009.10.15 |
| එන්.එම්.ඒ.කේ.නවරත්න | 70 | 2007.12.03 | 2009.10.15 |
| වයි.පී.ලලිත් | 71 | 2007.12.03 | 2009.10.15 |
| බී.එච්.පුෂ්පකුමාරි | 73 | 2007.12.03 | |
| ටී.ටී.ටී.ඩී.සිල්වා | 74 | 2007.12.03 | |
| ඩබ්.පී.එස්.සිසිලරත්න | 75 | 2008.04.01 | |
| එම්.ඩී.ඩී.දීපවංශ | 76 | 2008.04.01 | |
| ඩබ්.එම්.ඒ.යූ.වීරතුංග | 77 | 2008.04.07 | |
| පී.එස්.ටී.කේ.පෙරේරා | 78 | | 2009.10.15 |
| පී.එස්.උඩුවන | 79 | | 2009.10.15 |

05. 2012.01.27 දින සිට හඳුන්වා දුන් නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව (ඇමුණුම් 06) මුලින් පැවති ශ්‍රේණි 4 ශ්‍රේණිය 3 බවට පත්කර ඇත. සංඛ්‍යාලේඛනඥ හා ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ යන තනතුරු ඒකාබද්ධ කර ඇත.

06. මෙම ඒකාබද්ධ කිරීමේ කාර්යයේදී ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ යන තනතුර දැරූ අයට ප්‍රමුඛතාවයක් දිය යුතු වුවත්, සේවා කාලය අනුව පමණක් සළකා මෙම කටයුතු සිදු කිරීම තුළ ජ්‍යෙෂ්ඨතා ලේඛනය පිළිබඳ වෙනස්වී ඇත.

එම වෙනස්වීම 2026.04.30 දින ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මෙම අධිකරණයට ඉදිරිපත් කරන ලද ජ්‍යෙෂ්ඨතා ලේඛනය අනුව පැහැදිලිවේ.

I ශ්‍රේණිය

| ජ්‍යෙෂ්ඨතා අංකය | නම | වර්තමාන තනතුර | I ශ්‍රේණියට උසස් වූ දිනය | III ශ්‍රේණියේ රාජකාරී භාරගත් දිනය |
|---|---|---|---|---|
| 07 | බී.එච්.පුෂ්පකුමාරි | අධ්‍යක්ෂ (සංඛ්‍යාන) (වැ.බ | 2024.12.03 | 2007.12.03 |
| 08 | එම්.ටී.ටී.ද සිල්වා | අධ්‍යක්ෂ (සංඛ්‍යාන) (වැ.බ | 2024.12.03 | 2007.12.03 |
| 09. | ඩබ්.පී.එස්.සිසිලරත්න | අධ්‍යක්ෂ (සංඛ්‍යාන) (වැ.බ | 2025.04.01 | 2008.04.01 |
| 10. | එම්.ඩී.ඩී.ඩී.දීපවංශ | අධ්‍යක්ෂ (සංඛ්‍යාන) (වැ.බ | 2025.04.01 | 2008.04.01 |
| 11. | ඩබ්.එම්.ඒ.යූ.බී.වීරතුංග | අධ්‍යක්ෂ (සංඛ්‍යාන) (වැ.බ | 2025.04.07 | 2008.04.07 |

II ශ්‍රේණිය

| ජ්‍යෙෂ්ඨතා අංකය | නම | වර්තමාන තනතුර | II ශ්‍රේණියට උසස් වූ දිනය | විධායක ශ්‍රේණියේ රාජකාරී භාරගත් දිනය |
|---|---|---|---|---|
| 02 | පී.ටී.කේ.එස්.පෙරේරා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) | 2019.10.15 | 2009.10.15 |
| 03 | කේ.කේ.සී.ශිරෝමලී | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) | 2019.10.15 | 2007.12.03<br>2009.10.15 |
| 09. | එන්.එම්.ඒ.කේ.නවරත්න | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) | 2019.10.15 | 2007.12.03<br>2009.10.15 |

07. ඉහත සටහන අනුව පැහැදිලිව පෙනී යන්නේ, 2007 වසරේ පත්වීම් ලැබූ අන් සියළු දෙනාම අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම්, වසර 10 තුළ II ශ්‍රේණියේ සහ ඉන්පසුව I ශ්‍රේණියේ පත්වීම් ලැබ ඇති බවයි.

08. එසේ වුවත් අභියාචකවරු සේවා කඩවීමකින් තොරව ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ තනතුරු භාර ගැනීම නිසා, 2009.10.15 දින සිට වසර 10න් පසුව 2019.10.15 දින II ශ්‍රේණිය ලැබ ඇති බවයි.

09. ඒ අනුව පැහැදිලිවම අභියාචකවරු 02 හා වී.පී.ලලිත් නමැති අයට අගතියක් සිදුවී ඇති බැව් පැහැදිලි වේ. එසේ වුවත් වී.පී.ලලිත් නැමැති අය මෙම අධිකාරයට පැමිණ නැත. එම නිසා ඒ අය පිළිබඳව මෙහිදී සාකච්ජා නොකරමු.

මේ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තම අදහස් හා නිරීක්ෂණ විවෘත අධිකරණයේ දී වාචික ප්‍රකාශ ලෙස සහ 2025.08.20, 2026.03.23, හා 2026.03.30 දිනැති ලිපි සහ ඇමුණුම් මඟින් ඉදිරිපත් කර ඇත.

2025.08.20 දින දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වාර්තාව අනුව අංක 06 යටතේ 2000 වසරට පෙර හා පසුව දෙපාර්තමේන්තුවේ ව්‍යුහය දක්වා ඇත. බඳවා ගැනීමේ ක්‍රමවේදය හා සුදුසුකම් 7, 8, හා 9 ජේද යටතේ දක්වා ඇත. මේ කටයුතු වලදී පළමු පරිපාලන වැරද්ද සිදුවී ඇති බව දන්වා සිටී. ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ බඳවා ගැනීම තුළ මෙවැනි පරිපාලන වැරදිද සිදුවී ඇති බව දක්වා සිටී. මෙම සංඛ්‍යාලේඛනඥ හා ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ තනතුරු ඒකාබද්ධ කිරීමේ දී නිසි ක්‍රමවේදය භාවිතා නොවීම නිසා 3 වැනි පරිපාලන වරද සිදුවී ඇති බව දක්වා සිටී.

මෙම කරුණ පිළිබඳව අසාධාරණයට ලක්වූ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ නිලධාරීන් විසින් SCFR 591/2012 යටතේ අධිකරණයට ගොස් ඇත. එසේ වුවත් නියමිත කාලය තුළ අදාළ අධිකරණ ක්‍රියා මාර්ග ගෙන නොතිබීම මතම එම ඉල්ලීම ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් ප්‍රතික්ෂේප කර ඇත. මෙම ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ අතුරින් වැඩිම අගතියක්, අසාධාරණයක් සිදුවී ඇත්තේ මෙම අභියාචකවරුන්ටය. ඒ බැව් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරිපත් කළ මෙම නිරීක්ෂණ පත්‍රිකාවේ 49 සහ 50 ඡේදයන් අනුව පැහැදිලි කර ඇත.

"49. However, had they remained in the post of statistician without accepting the post of Senior statistician, they would have secured all subsequent promotions approximately two years earlier since, if that were the case, their service would be computed from 03.12.2007 (i.e., the date of their previous appointment to the post of statistician).

50. This situation obviously unfair by the two officers. In effect, they have been penalized for being successful to be selected for a higher post at the time."

51 ඡේදය යටතේ ජන ලේඛන හා සංඛ්‍යාලේඛනඥ අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම නිලධාරීන් දෙදෙනාගේ III ශ්‍රේණියේ සේවා කාලයට ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ තනතුරේ පෙර සේවා කාලය ගණනය කිරීම නිර්දේශ කර, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාවද එය යුක්ති සහගත බව පිළිගෙන ඇති අතර එහෙත් එය නිවැරදි කිරීම සඳහා කටයුතු කර ඇති බවත් නොපෙනේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව දන්වා සිටින්නේ, මේ වන විටත් උසස්වීම් ලද පිරිස සිටින බැවින්, ඒ අයට සහ වැඩි සේවා කාලයක් තිබෙන අය උසස්වීම් ලබා සිටින බැවින්, ඒ අයට අසාධාරණයක් සිදුවිය හැකි බවය.

ඉහත සියළු කරුණු පිළිබඳව සැළකීමේ දී මෙම අභියාචකවරුන් දෙදෙනාට අයුක්තියක් සිදුවී ඇති බව පැහැදිලිව පෙනෙන නිසාත්, ඒ බැව් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්ද පිළිගන්නා බැවින් ද, එසේ වුවත් දැනටමත් උසස්වීම් ලබා සිටින අයට අගතියක් නොවන අයුරින් හා ඒ අයගේ ජ්‍යෙෂ්ඨතාවයට හානියක් නොවන අයුරින් මෙම අභියාචකවරුන් සඳහා ද උසස්වීම් ලබාදීම සුදුසු බවට යෝජනා කරමු. අදාළ සියළු සුදුසුකම් සපුරා ඇති බැවින්, දැනටමත් උසස්වීම් ලබා සේවයේ යෙදෙන අයගේ

ජ්‍යෙෂ්ඨත්වයට හානියක් නොවන ලෙස මෙම අයටද උසස්වීම් පෙරදාතම් කර ලබාදීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට නියෝග කරමු. ඒ අනුව කොන්දේසි වලට යටත්ව අභියාචනය සඳහා ඉඩ ලබාදී ඇත. මෙම තීරණය අභියාචකවරුන්, ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

සංශෝධන වලට යටත්ව අභියාචනයට ඉඩදී ඇත.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-